සකස් කළේ - ශාන්ත ධර්ම ශ්‍රී විතාරණ
මයා,ර/ෆර්ගසන් උසස් විදුහල.

නිපුණතාව 10 - හවුල් ව්‍යාපාරයක ,මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

නිපුණතා මට්ටම 10.1 - හවුල් ව්‍යාපාරයක ගිණුම්කරණයට අදාළ නෛතික පරිසරය පැහැදිලි කරයි.

**<u>හවුල් ව්‍යාපාර නිර්වචනය</u>**

1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුව

ලාභ ලැබීමේ චේතනාවෙන් පොදුවේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන පුද්ගලයින් අතර පවතින සම්බන්ධතාවය හවුල් ව්‍යාපාරයකි.

**<u>හවුල් ව්‍යාපාරයකට අත්‍යාවශ්‍ය ලක්ෂණ</u>**

1.පුද්ගලයින් සිටීම

2.ලාභ ලැබීමේ චේතනාව

3.ව්‍යාපාරයක් පැවතීම

4.පොදු එකඟතාවය

**<u>හවුල් ගිවිසුම (Partnership Agreement)</u>**

හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වා ගෙන යන ආකාරය හා හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ බලතල පිළිබඳව හවුල්කරුවන් අතර ඇතිකර ගනු ලබන පොදු එකඟතා මාලාවයි.

**<u>හවුල් ගිවිසුමක් ඇතිවිය හැකි ආකාර</u>**

1.වාචිකව (කට වචනයෙන් )

2.ලිඛිතව

3.ව්‍යංගයෙන් (ඇඟවීමෙන්)

**<u>අභ්‍යාස</u>**

1.ලිඛිත හවුල් ගිවිසුමක අඩංගු මූලික කරුණු 5ක් ලියන්න.